හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

වෙළුම 47
2023 තුන්වන කලාපය
ISSN 1991- 0040 X

# ගොවිකටයුතු පුවත් හසුන

## හෙක්ටර් කොබ්බෑකඩුව ශ්‍රීමතාණන්ගේ 40 වන ගුණ සමරුව



හෙක්ටර් කොබ්බෑකඩුව මහතාගේ දර්ශනය අඛණ්ඩවම අනුගමනය කළා නම් කෘෂිකර්මාන්තය තුළ අද අප මුහුණපාන අර්බුද කිසිසේත් මතු නොවන බව කෘෂිකර්ම අමාත්‍ය මහින්ද අමරවීර මහතා පැවසීය. කෘෂිකර්ම අමාත්‍යතුමා මේ බව පැවසුවේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ නිර්මාතෘ හිටපු කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍ය, දිවංගත හෙක්ටර් කොබ්බෑකඩුව ශ්‍රීමතාණන්ගේ 40 වන ගුණ සමරුව නිමිත්තෙන් සංවිධානය කළ ගුණ සමරු උත්සව සභාව අමතමිණි. අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පසුගිය සැප්තැම්බර් 20 ආයතන පරිශ්‍රයේ දී මෙම ගුණසමරු වැඩසටහන පැවැත්විණි.

එම අවස්ථාවට හිටපු ජනාධිපති ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, කථානායක මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා, කෘෂිකර්ම අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමා, හෙක්ටර් කොබ්බෑකඩුව පවුල නියෝජනය කරමින් ටිකිරි කොබ්බෑකඩුව මැතිතුමා, ආචාර්ය පාලිත කොහොන මහතා සහ එම පවුලේ ඥාතීන් ද සහභාගී වූහ.

රාජ්‍ය අමාත්‍යවරු වන ලසන්ත අලගියවන්න, මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා, සුරේන් රාඝවන්, කේ.කාදර් මස්තාන් යන මහත්වරු මෙන්ම පාර්ලිමේන්තුවරු මන්ත්‍රීවරුන් වන දුමින්ද දිසානායක මහතා, ජගත් පුෂ්පකුමාර මහතා, දුෂ්මන්ත මිත්‍රපාල මහතා, ජගත් කුමාර මහතා සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් ගුණදාස සමරසිංහ මහතා ඇතුළු නිලධාරීන් පිරිසක් ද සහභාගී වූහ.

# හෙක්ටර් කොබ්බෑකඩුව ශ්‍රීමතාණන්ගේ පිළිරුවට පුෂ්පෝපහාර දැක්වීම





අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, මධ්‍ය පළාත් සභාවේ හිටපු මහ ඇමති සරත් ඒකනායක මහතා සහ හෙක්ටර් කොබ්බෑකඩුව ශ්‍රීමතාණන්ගේ පවුල නියෝජනය කරමින් සබරගමුව පළාත් හිටපු ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුව මහතා පුෂ්පෝපහාර දක්වන අයුරු

## ආරාධිත දේශන





කෘෂිකර්ම අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමා



හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා



මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස මහතා විසින් හෙක්ටර් කොබ්බෑකඩුව ගුණ සමරු දේශනය පවත්වන අයුරු




හෙක්ටර් කොබ්බෑකඩුව ශ්‍රීමතාණන්ගේ යුග මෙහෙවර අලළා ප්‍රකාශන අංශය විසින් සකස් කළ 'හෙක්ටර් කොබ්බෑකඩුව නිහඬ විප්ලවය' අනුස්මරණ කෘතිය අධ්‍යක්ෂතුමා විසින් හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා වෙත පිළිගන්වන අයුරු

## හෙක්ටර් කොබ්බෑකඩුව ගුණ සමරුව නිමිත්තෙන් පුෂ්පෝපහාරයක්



**හෙ**ක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ නිර්මාතෘ දිවංගත හෙක්ටර් කොබ්බෑකඩුව ශ්‍රීමතාණන්ගේ 40 වන ගුණසමරුව නිමිත්තෙන් හෙක්ටර් කොබ්බෑකඩුව සංසදය විසින් සංවිධානය කළ ගුණ සමරු උත්සවයක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දී පැවැත්විණි.

දේශීය කෘෂිකර්මාන්තයේ උන්නතිය උදෙසා කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යවරයෙකු වශයෙන් ඔහු සිදු කළ අනුපමේය මෙහෙය මෙහිදී සිහිපත් කෙරිණි.

පුෂ්පෝපහාර දැක්වීමේ අවස්ථාවට හෙක්ටර් කොබ්බෑකඩුව සංසදයේ නිලධාරීහු, හෙක්ටර් කොබ්බෑකඩුව මහතාගේ පවුලේ ඥාතීහු සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය ජී.ජී බන්දුල මහතා ඇතුළු නිලධාරීහු පිරිසක් සහභාගී වූහ.



## කෘෂිකර්ම රාජ්‍ය ඇමතිතුමාගේ නිරීක්ෂණ චාරිකාව



**කෘ**ෂිකර්ම රාජ්‍ය අමාත්‍ය මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා සැප්තැම්බර් 14 දින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ නිරීක්ෂණ චාරිකාවකට සහභාගි විය.

2023 වර්ෂයේ ආයතනය විසින් ක්‍රියාවට නංවනු ලබන පර්යේෂණ හා පුහුණු කිරීමේ කටයුතු පිළිබඳ ව රාජ්‍ය අමාත්‍යතුමාගේ අවධානයට ලක්විය.

මෙම අවස්ථාවට කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරීහු, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය ජී.ජී බන්දුල මහතා, අතිරේක අධ්‍යක්ෂ (වැඩබලන) ආචාර්ය එන්.පී.ජී සමන්ත මහතා ඇතුළු පර්යේෂණ කාර්ය මණ්ඩලය සහභාගි වූහ.



අධ්‍යක්ෂතුමා විසින් ආයතනයේ පර්යේෂණ වාර්තා කෘෂිකර්ම රාජ්‍ය ඇමැතිතුමා වෙත පිළිගන්වන අයුරු



# ශ්‍රී ලංකාවේ කුකුළු ආහාර නිෂ්පාදනය: ආර්ථික අර්බුදයේ බලපෑම, ප්‍රතිචාර සහ ඉදිරි ගමන්මග

මෙරට ජනතාවට අවශ්‍ය සත්ත්ව ප්‍රෝටීන පරිභෝජනයට ඉතා ඉහළ දායකත්වයක් ලබා දෙන්නේ කුකුළු මස් සහ බිත්තර නිෂ්පාදන ක්ෂේත්‍රයයි. ආර්ථික අර්බුදයට පෙර කුකුළු මස් සහ බිත්තර මිල සාපේක්ෂව ලාබදායී සහ දැරිය හැකි මට්ටමකින් පැවතුණි. එහෙත් පසුගිය වසර එක හමාරක පමණ කාලයක සිට කුකුළු මස් සහ බිත්තර මිල ගණන් පෙර නොවූ විරූ මට්ටමින් ඉහළ ගොස් තිබේ.

ශ්‍රී ලංකාවේ ආර්ථිකය වර්තමානයේ මුහුණ දී ඇති අර්බුදකාරී තත්ත්වය මෙරට විවිධ කර්මාන්තවලට බලපා ඇති අතර අමුද්‍රව්‍ය හිඟය, නිෂ්පාදන පිරිවැය ඉහළ යාම, ආහාර මිල ඉහළ යාම හේතුවෙන් කුකුළු ආහාර අංශයට ද එය විශාල බලපෑමක් ඇති කර තිබේ. ඩොලර් අර්බුදය හේතුවෙන් කර්මාන්තවලට ආහාර සැකසීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීමට නොහැකි වූ අතර, 2022 දී කෘෂිකාර්මික යෙදවුම්වල පවතින හිඟ බව සහ ඉහළ මිල හේතුවෙන් නිෂ්පාදනය පහත වැටීම නිසා බඩ ඉරිඟු වැනි අමුද්‍රව්‍ය දේශීය නිෂ්පාදනයට බලපෑවේය. මේ හේතුවෙන් කුකුළු ආහාර නිෂ්පාදනය ද අර්බුදකාරී තත්ත්වයකට පත් විය.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරිමේ ආයතනයේ ආහාර පද්ධති අංශය විසින් සිදු කරනු ලැබූ මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ආර්ථික පසුබෑම් සමය තුළ කුකුළු ආහාර නිෂ්පාදකයින්ගේ තත්ත්වය, ඔවුන්ට එල්ල වී ඇති බලපෑම් සහ ඊට මුහුණ දීම පිණිස ඔවුන් අනුගමනය කරන ලද අර්බුද කළමනාකරණ උපාය මාර්ග පරීක්ෂා කර බැලීමයි.

ඒ තුළින් කුකුළු ආහාර අංශය ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්තිමය නිර්දේශ යෝජනා කිරීම අපේක්ෂාවයි.

සෙසු අරමුණු අතර

- ශ්‍රී ලංකාවේ කුකුළු ආහාර නිෂ්පාදන අංශයේ වත්මන් තත්ත්වය පරීක්ෂා කිරීම.
- කුකුළු ආහාර නිෂ්පාදන අංශයේ මහා, මධ්‍යම හා කුඩා පරිමාණ මට්ටමේ නිෂ්පාදකයින් මත ආර්ථික අර්බුදයේ බලපෑම තක්සේරු කිරීම.
- කුකුළු ආහාර නිෂ්පාදන අංශයේ මහා පරිමාණ, මධ්‍යම හා කුඩා පරිමාණ නිෂ්පාදකයින් විසින් අනුගමනය කරන ලද අර්බුද කළමනාකරණ උපාය මාර්ග හඳුනා ගැනීම.
- කුකුළු ආහාර නිෂ්පාදනය සඳහා ඇති බාධාවන්, අභියෝග සහ අවස්ථා හඳුනා ගැනීම.

මහා පරිමාණ, මධ්‍ය පරිමාණ සහ කුඩා පරිමාණ නිෂ්පාදකයින් වැඩි වශයෙන් විසිරී සිටින ප්‍රදේශ වන කුරුණෑගල, ගම්පහ, පුත්තලම සහ කොළඹ යන දිස්ත්‍රික්ක ආශ්‍රිත ව අධ්‍යයන ක්ෂේත්‍ර තෝරා ගෙන තිබේ. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි රුවිනි විදානපතිරණ මහත්මියගේ සම්බන්ධීකරණයෙන් සිදු කරන අධ්‍යයනයෙහි පර්යේෂණ කණ්ඩායම වශයෙන් ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි රෝෂිණී රඹුක්වැල්ල මිය, පර්යේෂණ නිලධාරීන් වන රවීනා උදාරි, සංගීත් ප්‍රනාන්දු, දිලිනි පෙරේරා යන මහත්ම මහත්මීහු කටයුතු කරති.

# දේශගුණික කම්පනවලට ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ අවදානම අවම කිරීම සඳහා ඒකාබද්ධ ඊ- ව්‍යාප්ති සේවාවන් භාවිතා කිරීම පිළිබඳ අධ්‍යයනය



ගොවිපොළ තොරතුරු සහ උපදෙස් කාලීනව, සවිස්තරාත්මකව සහ පරිශීලනය කිරීමට පහසු ආකාරයට ලබා ගැනීමට හැකියාව තිබීම ගොවීන්ගේ ඵලදායීතාවයට මෙන් ම කාර්යක්ෂමතාවයට ද විශාල වශයෙන් බලපායි. කෘෂිකර්ම ව්‍යාප්ති සේවාව ක්‍රමවත් හා ප්‍රමාණවත් පරිදි භෞතිකව දිවයින පුරා ව්‍යාප්ත වී නොතිබීම හේතුවෙන් ගොවීහු විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දෙති. මෙවැනි සන්දර්භයක් තුළ, ගොවි ප්‍රජාවන් සහ අගය දාම ක්‍රියාකාරීන් අතර ඇති පරතරය අවම කර නවමු කාර්යභාරයක් ඉටු කිරීමේ හැකියාව e ව්‍යාප්ති සේවාවන්ට තිබේ. එමගින් නිරන්තරයෙන් ඇතිවන කාලගුණ වෙනස්වීම්වලට මුහුණ දීමට හැකිවන පරිදි ගොවීන්ව යාවත්කාලීන දැනුමින් සන්නද්ධ කිරීමට හැකියාව තිබේ.

එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) S.E.E.D. Hub නමින් ඒකාබද්ධ e ව්‍යාප්ති සේවා වේදිකාවක් නිර්මාණය කර ඇති අතර එමඟින් ගොවීන්ගේ ඵලදායිතාව ඉහළ නැංවීමට සහ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමේ විභවතාව ඉහළ නැංවීමට අපේක්ෂා කරයි.

එම අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් පුහුණු සැසි 55ක් පවත්වන ලද අතර S.E.E.D. Hub ඊ ව්‍යාප්ති වේදිකාවේ මූලිකාංග හඳුන්වා දීම, එහි විවිධ මොඩියුල පැහැදිලි කිරීම, ඊට ප්‍රවේශ වන ආකාරය සහ එය භාවිතා කරන ආකාරය තේරුම් ගන්නේ කෙසේද යන්න පිළිබඳව සහභාගීවන්නට මගපෙන්වීම, ගොවීන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන ආකාරය වැනි කරුණු පැහැදිලි කිරීම මෙම පුහුණු සැසිවලින් සිදු කෙරේ.

මෙම පුහුණුව දිස්ත්‍රික්ක 10ක පැවැත් වූ අතර විශේෂයෙන් වී ගොවීන් ඉලක්ක කර ගෙන සකස් කර තිබේ. මෙම ව්‍යාපෘතිය 2022 ඔක්තොම්බර් මාසයේ ආරම්භ කරනු ලැබුවේ එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ තාක්ෂණික හා මූල්‍ය දායකත්වයෙන් සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ ක්‍රියාකාරී දායකත්වයෙනි.

රටේ වී ගොවීන් අතර ජාතික නියෝජිත මූලික ගෘහ මට්ටමේ සමීක්ෂණයක් පැවැත්වීම මෙම ව්‍යාපෘතියේ පුළුල් අරමුණයි. තෝරාගත් දිස්ත්‍රික්ක 10හි (මාතර, ගාල්ල, අනුරාධපුර, කෑගල්ල, කුරුණෑගල, කිලිනොච්චිය, මඩකලපුව, අම්පාර, බදුල්ල සහ වවුනියාව) වී වගාවට සම්බන්ධ කුටුම්භ 2,200 කින් එකතු කරන ලද ජාතික නියෝජිත සමීක්ෂණ දත්ත සමඟ මූලික සමීක්ෂණය සමන්විත විය. මෙම සමීක්ෂණය සඳහා සෑම දිස්ත්‍රික්කයකින්ම ගොවි සංවිධාන විසිදෙකක් සහ එක් ගොවි සංවිධානයකින් ගොවීන් 10 දෙනකු බැගින් තෝරා ගන්නා ලදී. ඊ ව්‍යාප්ති වේදිකාව භාවිතා කිරීම පිළිබඳ ගොවීන් පුහුණු කිරීම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් මාලාවක් ද 2023 ජූලි මස 30 සහ ජූලි 01 දින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දී පවත්වන ලදී.

පුහුණු වැඩසටහනේ නියමු කණ්ඩායම ලෙස ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් වන සිදත් බණ්ඩාර, ශාන්ත හේවගේ, ටී.පී මුණවීර, ගීතානි සමරසිංහ, චින්තක ජයසූරිය යන මහත්ම මහත්මීන් ද පර්යේෂණ නිලධාරීන් වන දිනූෂා රත්නායක හා තුෂාරා ධර්මවර්ධන යන මහත්මීන්ද කටයුතු කරති.



# විශිෂ්ට කෘෂි විද්‍යාඥයෙකුගේ නික්ම යාම

## ආචාර්ය සී. ආර් පානබොක්ක

දේශීය හා ජාත්‍යන්තර වශයෙන් කීර්තිමත් පාංශු විද්‍යාඥයෙකු වන සී.ආර් පානබොක්ක මහතා අගෝස්තු 29 දින අභාවප්‍රාප්ත විය.

ශ්‍රී ලංකාවේ පස සහ පොහොර භාවිතය, ශ්‍රී ලංකාවේ භූගත ජල තත්ත්වය, කුඩා ගම්මාන වැව් පද්ධති සහ ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප යන විෂයයන් පිළිබඳ ව ඔහු ප්‍රාමාණික උගතෙකු විය.

ඒ දැනුම ඇසුරෙන් ග්‍රන්ථ ගණනාවක් සහ දෙස් විදෙස් පර්යේෂණ පත්‍රිකා රැසක් ඔහු විසින් සම්පාදනය කර තිබේ.

1974 වර්ෂයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පර්යේෂණ) ධූරයේ වැඩ බාර ගැනීමෙන් අනතුරුව මාකදුර , කිලිනොච්චිය, අරලගංවිල, බෝඹුවෙල සහ කරදියනාරු යන ප්‍රදේශවල පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීමෙන් කෘෂිකාර්මික පර්යේෂණ ක්ෂේත්‍රය පුළුල් කිරීමට හෙතෙම මාර්ගෝපදේශකත්වය සැපයීය. අනතුරුව 1979 සිට 1982 දක්වා කාලය තුළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් ධූරය දැරීය.

විශ්‍රාම ලැබීන් පසු ඒ මහතා තම විශේෂඥ දැනුම බෙදා හදා ගනිමින් වසර කිහිපයක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ බාහිර උපදේශකයෙකු වශයෙන් කටයුතු කළේය. එම කාල සීමාව තුළ ඔහු විසින් සම්පාදනය කළ Small Village Tank System of Sri Lanka : Their Evolution, Setting, Distribution and Essential Functions නම් කෘතියට එම විෂයට අදාළ දැනුම සොයා යන පිරිස්වලින් අදටත් ඉහළ ඉල්ලුමක් පවතී.


ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කුඩා වැව් විකාශනය , පිහිටීම, ව්‍යාප්තිය සහ ඉටු කරන අත්‍යවශ්‍ය සේවා නමින් එම කෘතිය සිංහලයට පරිවර්තනය වී තිබේ.

ආචාර්ය පානබොක්ක මහතා පාංශු විද්‍යාවට සහ කෘෂිකර්මාන්තයට සිදු කළ සේවය වෙනුවෙන් 1986 වර්ෂයේ විද්‍යා ජෝති ගෞරව අභිධානයෙන් පිදුම් ලද අතර 1998 වර්ෂයේ දේශමාන්‍ය ජනාධිපති සම්මානයෙන් පිදුම් ලබා තිබේ.

**මාසික ප්‍රසිද්ධ දේශන මාලා**

**තුන්වන කාර්තුව**

**සංවිධානය**
**අධ්‍යාපන හා පුහුණු අංශය**











## කෘෂි ව්‍යවසායකයින් ලෙස ගොඩනැගීම සඳහා පවතින අවස්ථා සම්බන්ධයෙන් ග්‍රාමීය තරුණ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන

කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ගාල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්ක ඉලක්ක කරගෙන 'තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන නියමු ව්‍යාපෘතිය' නමින් විශේෂ ව්‍යාපෘතියක් දියත් කරන ලදී. එම වැඩසටහන යටතේ ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් කිහිපයක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලදී.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගම්මාන 07ක් සහ ගාල්ල දිස්ත්‍රික්කයේ ගම්මාන 03ක් සංවර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කළ මෙම විශේෂ වැඩසටහන ආරම්භ වූයේ 2023 ජුනි මාසයේ ය. කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සිදු කළ විශේෂ ඉල්ලීම පරිදි අධ්‍යාපන හා පුහුණු අංශය විසින් පළමු අදියරේ ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් රැසක් ගම් මට්ටමින් පවත්වන ලදී.

'තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන, නියමු ව්‍යාපෘතියෙහි මූලික අරමුණ තරුණයන්ගේ මූලිකත්වය ඇතිව ව්‍යවසායක ගම්මාන බිහි කිරීමය. ව්‍යවසායක අවස්ථා හඳුන්වා දෙමින් ඒ සඳහා තරුණ පිරිස් අභිප්‍රේරණය කිරීම සඳහා සකස් කළ එක් දින පුහුණු වැඩසටහනක් සැසි කිහිපයකින් සමන්විත විය.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය , කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය යන ආයතන ද අනෙකුත් සැසි සඳහා සම්බන්ධ වී තිබේ. පුහුණු වැඩසටහනේ සම්බන්ධීකාරක වශයෙන් අධි පර්යේෂක ආනන්ද සමරකෝන් මහතා කටයුතු කළ අතර සම සම්බන්ධීකාරක වශයෙන් ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී චින්තක ජයසූරිය මහතා කටයුතු කළේය. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී චතුර ජයම්පති මහතා සහ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි සුසිලා ලූර්දු මහත්මිය පුහුණු කණ්ඩායමට ඇතුළත් වෙති.

## ගෘහ ඒකකයන්හි ආහාර සුරක්ෂිතතාවය පවත්වාගෙන යාම පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන



ආර්ථික අභියෝග හමුවේ ග්‍රාමීය හා අර්ධ නාගරික ප්‍රදේශයන්හි සීමිත සම්පත් සහිත වටපිටාවක ජීවත් වන ප්‍රජාවගේ ආහාර සුරක්ෂිතභාවය පවත්වා ගෙන යාම සඳහා ගෘහ ඒකක මට්ටමෙන් සිදු කළ හැකි ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රජාවගේ දැනුම, ආකල්ප වැඩි දියුණු කිරීම සහ ඒ සඳහා ඔවුන් පෙළඹවීම අරමුණු කර ගනිමින් මෙය සම්පාදනය කර තිබේ. ඊට අමතරව පහත සඳහන් කරුණු පිළිබඳව අවබෝධයක් ද සහභාගීවන්නන්ට ලබා දෙයි.

- ලංකාවේ ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රය වර්තමානයේ මුහුණ දෙන අභියෝග හා පිළියම්
- ගෙවත්ත ආශ්‍රිත බෝග හා සත්ත්ව නිෂ්පාදන සහ ආහාර සංරක්ෂණ ක්‍රම අනුගමනය කිරීම
- මූල්‍ය සාක්ෂරතාව සහ ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීම
- ආහාර පරිභෝජනයේ පෝෂණීය පැතිකඩ හා ආහාර සුරක්ෂිතතාවය

මොණරාගල සහ නුවරඑළිය දිස්ත්‍රික්ක දෙක ආවරණය කරමින් එක් දිස්ත්‍රික්කයකින් අනුපිළිවෙළින් වැඩසටහන් 10ක් වශයෙන් පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලැබිය. පුහුණු වැඩසටහනේ සම්බන්ධීකාරක වශයෙන් ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී චින්තක ජයසූරිය මහතා කටයුතු කළ අතර සම සම්බන්ධීකාරක අධි පර්යේෂක ආනන්ද සමරකෝන් මහතා වශයෙන් කටයුතු කළේය.

බාහිර සම්පත් දායකයින් ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, සෞඛ්‍ය ප්‍රවර්ධන නිලධාරී, ශ්‍රී ලංකා මහ බැංකුව නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලය, ශ්‍රී ලංකා සිටිසන්ස් කෝපරේටිව් බැන්ක් , මොණරාගල හැටන් නැෂනල් බැංකුව ආදි ආයතනවල නියෝජිතයෝ සහභාගී වූහ.

# ගොවිකටයුතු පුවත් හසුන

*උපදේශකත්වය*

ආචාර්ය ජී.ජී බන්දුල
අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී

*අධීක්ෂණය*

ශාන්ත හේවගේ
අංශ ප්‍රධාන
තොරතුරු හා සන්නිවේදන අංශය

*සම්පාදනය*

වසන්ති රාජපක්ෂ
ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිනී

*නිර්මාණය හා පිටු සැකසුම*

උදේනි කරුණාරත්න


*ගොවිකටයුතු පුවත්හසුන
ප්‍රකාශනය, මුද්‍රණය සහ
බෙදා හැරීම*

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු
පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය

**0112 696981 - 0112 692423**


www.harti.gov.lk
https://www.facebook.com/hartilk
https://www.instagram.com/harti_lk/
http://twitter.com/harti_lk































හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ ප්‍රකාශන ඒකකය මඟින් පළ කෙරෙන ත්‍රෛමාසික ප්‍රකාශනයකි. ගොවිකටයුතු ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා පුහුණු වැඩසටහන්වල දී ලබා ගන්නා පර්යේෂණ හා පුහුණු තොරතුරු මෙමඟින් ප්‍රකාශයට පත් කෙරේ.

ලබා ගත් මූලය සඳහන් කරමින් මෙහි ඇති කරුණු උපුටා ගත හැකිය.